# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2494/51 - 2026 ජුනි මස 26 වැනි සිකුරාදා - 2026.06.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය:*

මෙහි මහජන කටයුත්තක් යනු පයිනස් වන වගාවේ සංරක්ෂණ කටයුතු සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩමක් අත්කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම්මඩුව ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2025.10.31 දිනැතිව සකස්කර ඇති කැඩැස්තර සිතියම් අංක 310274 හි කැබලි අංක 01 වශයෙන් දක්වා ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 4.4684ක් වන ගම්මඩුව 02/007 පයිනස් වන වගාව නමැති ඉඩම.

**කැබලි අංක 01 - ඉඩම් හිමිකම් කියන්නාගේ නම: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 4.4684.**

*උතුරට*: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ගම්මඩුව වත්ත; *නැගෙනහිරට*: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ගම්මඩුව වත්ත; *දකුණට*: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ගම්මඩුව වත්ත; *බටහිරට*: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ගම්මඩුව වත්ත;

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනා, තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026.08.24 වැනි දින පෙ.ව. 10.30 ට අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2026.08.10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. ඉඩමට ඇති හිමිකම් තහවුරු කිරීම සඳහා ඔප්පු හා අදාළ ලියකියවිලි පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

**ඩී.එම්. ඩබ්. ටී. යූ. දිසානායක,**
ප්‍රාදේශීය ලේකම්,
අඹන්ගඟකෝරළේ.

2026 ජුනි මස 23 වැනි දින,
අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0013



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය: පහතින් දක්වා ඇත.*
*කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ*
*යොමු අංකය: පහතින් දක්වා ඇත.*

උක්ත ශීර්ෂය යටතේ පහත 1 කොටසෙහි දැක්වෙන දිනයන්ට අදාළව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පහතින් දක්වා ඇති අංක දරන *අති විශෙෂ ගැසට් පත්‍රයන්හි* සඳහන් දැන්වීම්හි සඳහන්කර ඇති මා සම්මුඛ විය යුතු දිනයන් හා වේලාවන් මෙහි පහත 2 කොටසෙහි දැක්වෙන පරිදි සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | **1 කොටස** | | | | | | **2 කොටස** |
|---|---|---|---|---|---|---|---|
| *අනු. අංකය* | *ගැසට් පත්‍රයේ අංකය හා දිනය* | *මගේ අංකය* | *කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ යොමු අංකය* | *පිඹුර හා ග්‍රාම නිලධාරි වසම* | *කැබලි ගණන* | *ගැසට් පත්‍රයේ සඳහන් කර ඇති සම්මුඛ විය යුතු දිනය හා වේලාව* | *ගැසට් පත්‍රය සංශෝධනය කල පසු මා සම්මුඛ විය යුතු දිනය හා වේලාව* |
| 01 | 2135/58 (2019.08.08) | 5/3/4/1-(1891) | 4-3/7/2017/ එච්ඩබ්ලිව් /308 | මා1787 හා 2019.07.24 වැලමිටියාව (E440D) | 14 (කැබලි 1 14ක්) හෙක්ටයාර් 1.3712 | 2019.09.09 (පෙ.ව:10.00) | 2026.07.30 (පෙ.ව.9.00) |
| 02 | 2108/13 (2019.01.28) | 1782 | 4-3/7/2016/ එච්ඩබ්ලිව්/392 | මු.පි.මා.අ.1745 හා 2018.09.14 වැලමිටියාව (E440D) | 3 (කැබලි 1-3ක්) හෙක්ටයාර් 0.1060 | 2019.02.25 (පෙ.ව:10.00) | 2026.07.30 (පෙ.ව.9.00) |
| 03 | 2144/16 (2019.10.08) | 5/3/4/1-1833 | 4-3/7/2017/ එච්ඩබ්ලිව්/51 | මු.පි.මා 1781 හා 2019.09.10 පහලවැව (E445/D) | 10 (කැබලි1-10ක්) හෙක්ටයාර් 1.0102 | 2019.11.25 හා 26 (පෙ.ව:10.00) | 2026.07.30 (පෙ.ව.9.00) |
| 04 | 2144/16 (2019.10.08) | 5/3/4/1-1833 | 4-3/7/2017/ එච්ඩබ්ලිව්/51 | කැ.සි.අ.310035 කලාප 1(2019.09.10) පත්‍ර 10 අතුපාරයාය (E445/C) | 101 (කැබලි 207-320ක්) හෙක්ටයාර් 11.6383 | 2019.11.25 හා 2019.11.26 (පෙ.ව:10.00) | 2026.07.30 (පෙ.ව.9.00) |
| 05 | 2144/16 (2019.10.08) | 5/3/4/1-1833 | 4-3/7/2017/ එච්ඩබ්ලිව්/51 | අ.ග.පි.424 අති 8 (2019.09.10) පත්‍ර 08 රත්මල්ගහඇල (E445/A) | 87(කැබලි 598-698ක් ) හෙක්ටයාර් 6.0559 | 2019.11.25 හා 2019.11.26 (පෙ.ව:10.00) | 2026.07.31 (පෙ.ව.9.00) |
| 06 | 2144/12 (2019.10.08) | 5/3/4/1-1937 | 4-3/6/2018/ එච්ඩබ්ලිව්/63 | මු.පි.මා 1794 (2019.09.20) කපුවත්ත (E444/A) | 11(කැබලි 1-11ක්) හෙක්ටයාර් 0.2493 | 2019.11.27 (පෙ.ව:10.00) | 2026.07.31 (පෙ.ව.9.00) |
| 07 | 2108/14 (2019.01.28) | 1741 | 4-3/7/2016/ එච්ඩබ්ලිව්/424 | අ.ග.පි.475 (2018.11.05) අතිරේක 26 පත්‍ර 24 කිරලගොල්ල(E444B) | 1152-1171 (කැබලි 20ක්) හෙක්ටයාර් 2.9427 | 2019.02.26 හා 28 (පෙ.ව:10.00) | 2026.07.31 (පෙ.ව.9.00) |

එහි සඳහන් ඉඩම්වලට/පරවශතාවයන්ට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනා තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් ඉහත සඳහන්කර ඇති දිනයන් හි දී හා වේලාවන්හි දී දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2026.07.20 වන දිනට මත්තෙන් එම ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශතාවයන් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්,වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

**එන්.එම්. උපේක්ෂා කුමාරි,**
ප්‍රාදේශීය ලේකම්,
දඹුල්ල.

2026 ජූනි මස 22 වැනි දින,
දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0012

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.